**බුලත්සිංහල ප්‍රාදේශීය සභාව - 2021**

**------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**------------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**------------------------------**

බුලත්සිංහල ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට බුලත්සිංහල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**----------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**------------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

----------------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරුකිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන් ,ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ප්‍රමිතයේ 3.27 වගන්තියේ සිට 3.32 වගන්තිය අතර ඡේදයන්ට අනුකූලව සමාලෝචිත වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර නොතිබුණු බව පහත කරුණු අනුව නිරීක්ෂණය විය.<br>• අතිරික්තයේ හෝ ඌනතාවයේ හඳුනා ගත් ප්‍රාග්ධන ප්‍රදාන රු.7,793,058 ක් වුවත්,මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ එය රු.28,750,206 ක් ලෙස රු.20,957,148 ක් වැඩියෙන් දක්වා තිබුණි.<br>• ගෙවිය යුතු දෑ වල වැඩිවීම රු.20,917,173 මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ එකතු කර දැක්විය යුතු වුවත්, එය අඩුකර දක්වා තිබුණි.<br>• වෙනත් ජංගම වගකීම්වල අඩුවීම රු.2,493,210 මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ අඩුකර දැක්විය යුතු වුවත්, එය එකතු කර දක්වා තිබුණි.<br>• වර්ෂය තුල මුදලින් සිදුකළ දේපල, පිරියත හා උපකරණ මිලදී ගැනීම් රු.2,659,354 ක් වුවත්, ආයෝජන ක්‍රියාකාරකම් යටතේ එය රු.1,020,850 ක් ලෙස එනම් රු.1,638,504 ක් අඩුවෙන් දක්වා තිබුණි.<br>(ආ) ප්‍රමිතයේ 6.10 වගන්තිය ප්‍රකාරව වත්කමක පිරිවැයෙන් සමුච්චිත ක්ෂය සහ අවශේෂ අගය අඩුකළ පසු ලැබෙන වටිනාකම මත ක්ෂය කළයුතු වුවත්, සමාලෝචිත වර්ෂය සඳහා ක්ෂය ගණනය කිරීමේදී වත්කම්වල අවශේෂ අගයන් ඇස්තමේන්තු කර නොතිබුණ අතර වත්කම්වල පිරිවැය මත පදනම්ව ක්ෂය ගැලපීම් කර තිබුණි. | 2022 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව | පළාත් පාලන ආයතන සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළයුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) ප්‍රමිත අංක 11.9 ප්‍රකාරව ප්‍රතිපාදන පිළිබඳ හෙළිදරව් කළ යුතු වුවත්, බුලත්සිංහල මහජන ක්‍රීඩා පිටියේ අනුබෙදුම් ඉඩම සම්බන්ධයෙන් දේපළ වෙළඳාම් පුද්ගලික සමාගම විසින් සභාවට එරෙහිව පවරා තිබූ නඩුවට අදාලව 2021 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව පැවති රු.2,170,000 ක වන්දි මුදල් සම්බන්ධයෙන් හෙළිදරව් කර නොතිබුණි. | 2022 වර්ෂයේ නිවැරදිව හෙළිදරව් කරන බව | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළයුතුය. |

**1.6..2 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)සභාව සතු ඉඩම් 30 ක් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | | |
| (ආ) නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රතිපාදන මත ඉදිකිරීම් අවසන් කර 2019 පෙබරවාරි 25 දින සභාව වෙත භාරදී තිබූ බුලත්සිංහල බහුකාර්ය ගොඩනැගිල්ල සහ ඇගල්ඔය විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයෙහි වටිනාකම් තක්සේරු කර දේපල , පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | | |
| (ඇ)2018 දෙසැම්බර් 31 දිනැති අංක 04/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව රු.5,000 ට අඩු ස්ථාවර වත්කම් අදාල වත්කම් ගිණුම්වලින් ඉවත් කර ගබඩා තොගය යටතේ ඇතුළත් කළයුතු වුවත්, රු.769,800 ක් ස්ථාවර වත්කම් ගිණුම්වලින් ඉවත් කර තොග ගිණුම හර කිරීම වෙනුවට සංචිත හා වෙන් කිරීම් ගිණුමට හර කර තිබුණි. | 2022 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව | නිවැරදිව ගිණුම්ගත කළයුතුය. |
| (ඈ) භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව ඉවත් කිරීමට නිර්දේශ කර තිබූ රු.1,851,646 ක් අදාල වත්කම් ගිණුම්වලින් ඉවත් කර වර්ෂයේ අයභාර වියදම් ලෙස හඳුනාගත යුතු වුවත්, එසේ නොකර සංචිත හා වෙන් කිරීම් ගිණුමෙන් ඉහත වටිනාකම කපා හැර තිබුණි. | | |
| (ඉ) 2021 වර්ෂය තුල ලැබී තිබුණු ප්‍රාග්ධන ප්‍රදාන රු.36,543,264 ට අදාලව 2022 වර්ෂයේ සිට විස්තීර්ණ ආදායමට හඳුනාගත යුතු වුවත්, ඉහත ප්‍රාග්ධන ප්‍රදාන වලින් රු.1,640,758 ක් ජර්නල් අංක 68 මගින් සමාලෝචිත වර්ෂයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ අයභාරය යටතේ හඳුනා ගැනීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | | |
| (ඊ)2021 දෙසැම්බර් 31 දිනට අතිරික්තයේ හෝ ඌනතාවයේ හඳුනා නොගත් ප්‍රාග්ධන වියදම් ප්‍රදාන ශේෂය රු.91,516,773 ක් වියයුතු වුවත්, වත්කම් හා වගකීම් ප්‍රකාශය තුල එය රු.89,862,143 ක් ලෙස දැක්වීමෙන් වර්ෂයේ ස්කන්ධය රු.1,654,630 කින් අඩුවෙන් දක්වා තිබුණි. | | |

| | | |
|---|---|---|
| (උ) 2020 වර්ෂය තුල ලද ප්‍රාග්ධන ප්‍රදානවලින් රු.198,551 ක් ජර්නල් අංක 70 මගින් සමාලෝචිත වර්ෂයේ විස්තීර්ණ ආදායමේ හඳුනාගෙන තිබුණද එම වටිනාකම තුල 2021 වර්ෂය තුල පුස්තකාල පොත් සඳහා ලැබී තිබුණු ප්‍රාග්ධන ප්‍රදාන වලින් රු.13,864 ක්ද ඇතුලත් කර තිබීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.<br><br>(ඌ) 2021 වර්ෂය තුල මිලදී ගෙන තිබුණු බඳුන් හා උපකරණ රු.857,350 ක් හා යන්ත්‍ර රු.70,000 ක් සංචිත හා වෙන් කිරීම් ගිණුමට බැර කිරිම හේතුවෙන් වර්ෂයේ ස්කන්ධය රු.927,350 කින් වැඩියෙන් දක්වා තිබුණි. | 2022 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව | නිවැරදිව ගිණුම්ගත කළයුතුය. |

**1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විෂයය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 03 කට අදාලව මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වටිනාකම හා ඊට අනුරූපී වාර්තාවල දැක්වෙන වටිනාකම අතර රු.3,128,549 ක වෙනසක් විය. | 2022 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව | මූල්‍ය ප්‍රකාශන ශේෂ සහ උපලේඛන ශේෂ සමාන විය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.15,093,695 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.11,237,634 ක් විය.

### 2.2. ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2021දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.18,101,272 ක් හා මුද්දර ගාස්තු රු.21,126,375 ක් විය. | අදාල වර්ෂයේ උසාවි දඩ හා මුද්දර ගාස්තු වර්ෂය තුලදී අය නොවන බැවින් උපලේඛන සකස් කර නොමැති බව | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළයුතුය |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

## 3.1 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| නාගරික සංවර්ධන අධිකාරිය විසින් රු.153,351,216 ක පිරිවැයක් දරා බහු කාර්ය ගොඩනැගිල්ලක් ඉදිකර ප්‍රාදේශිය ලේකම්ගේ පැවරුම් නියෝග මගින් 2019 නොවැම්බර් සභාව වෙත පවරා තිබුණු අතර ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| (අ)බහු කාර්ය ගොඩනැගිල්ල ඉදි කිරිමට පෙර සභාවේ අවශ්‍යතාවය ඉදිරිපත් කර ඉදි කිරිම් සිදු කළයුතු වුවද, එම අවශ්‍යතාවය හඳුනා නොගෙන ඉදි කිරිම කර තිබුණි. | ඉදි කිරිමට පෙර සභාවේ අවශ්‍යතාවය පිළිබඳ විමසීමක් කර නොමැති බව | සභාවේ අවශ්‍යතාවය හඳුනාගෙන ඉදිකිරිම් කළයුතුය. |
| (ආ) නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉදිකර තිබු ඉහත ගොඩනැගිල්ල ප්‍රා දේශිය ලේකම් විසින් 2019 නොවැම්බර් 23 දින සභාවට භුක්තිය භාරදීමට කටයුතු කර තිබුණද 2022 අගෝස්තු 02 දින විටත් වසර 02 මාස 08 ක් ගතවී තිබුණද අයිතිය පවරා ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. | සභාවට අයිතිය පවරා ගැනීමට අවශ්‍ය ඉදිරි කටයුතු කරන බව | සභාවට අයිතිය පවරා ගැනීමට කටයුතු කළයුතුය. |
| (ඇ) උක්ත ගොඩනැගිල්ල 2019 නොවැම්බර් 23 සභාවට භුක්තිය පවරා දී තිබුණද , ඉදිකළ දිනයේ සිට වසර 03 කට ආසන්න කාලයක සිට භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | අඩක් නිම කර ඇති බැවින් භාවිතා කිරිමට නොහැකි වීමත් නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රතිපාද මත ඉදිරියේදී ඉදි කිරිම් කරන බව | නිෂ්කාර්ය වත්කම් භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) සභාව විසින් 2021 නොවැම්බර් 16 දින ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය වෙත කිසිදු ගාස්තුවක් අය කිරිමකින් තොරව බහු කාරයය ගොඩනැගිල්ල ලබාදීමට අවබෝධතා ගිවිසුමක් වසර 30 කට අත්සන් කළද එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මහ සභාවේ එකඟතාවය මත ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියට අවබෝධතා ගිවිසුමක් මගින් පවරා දී ඇති බව | ගිවිසුම් ප්‍රකාරව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළයුතුය. |